# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1852/35 - 2014 මාර්තු මස 05 වැනි බදාදා - 2014.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2011.

**1963 අංක 11 දරන මුදල් පනත**

72 වැනි වගන්තිය යටතේ වූ නියමය

කලින් කල සංශෝධිත පරිදි 1963 අංක 11 දරන මුදල් පනතේ 71 වැනි වගන්තිය සමඟ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු ඉහත කී පනතේ 72 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දහහතරක් වූ මාර්තු මස 05 වන දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මේ නියමය මගින් පවරා දෙමි.

මහින්ද රාජපක්ෂ,<br>
ජනාධිපති.

2014 මාර්තු මස 05 වන දින,<br>
ජනාධිපති ලේකම් කාර්යාලය,<br>
කොළඹ 01.

**උපලේඛනය**

1. උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වඩමාරච්චි කොට්ඨාසයේ, කඩ්ඩවේලි කෝවිල් පත්තුවේ, කරවෙඩ්ඩි කුරුලිකුරිච් හි "පලනියාවත්තෙයි" නැමති ඉඩම් ප්‍රමාණයෙන් වරගු වගා ලාච්චම් 22 1/4න් උතුරු දෙසින් එකී ලාච්චම් 22 1/4න් ලාච්චම් 7 1/4න් ලාච්චම් 3 5/8 (අ. 0, රූ. 0, ප, 33.75) ක් විශාල, නැගෙනහිරින් කන්දවනම් මුරුගේසු සහ තවත් අයට අයත් දේපළ ද, උතුරින් පොන්නයියාගේ වැන්දඹුව වන සෙල්ලාච්චිට සහ තවත් අයට අයත් දේපළ ද, බටහිරින් නවාසිවායම්ගේ භාර්යාව වන සින්නතංගම්ට සහ තවත් අයට අයිති දේපළ ද සහ දකුණින් සින්නතම්බි මයිල්වාගනම්ට සහ තවත් අයට අයිති දේපළ ද, යන මායිම් තුළ පිහිටි ඉඩම සහ ඊට අයිති සියළු දේත්, මෙම ඉඩමට බටහිරින් මන්තියෝලෙයි නැමැති ඉඩමේ ඇති ළිඳේ ජල කොටස සහ මාර්ග අයිතිය ද වේ.

මෙම ඉඩම පේදුරුතුඩුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 441/148 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

2. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේපත්තුවේ මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මහරගම නගර සභා කොට්ඨාසයට අයත් වන දෙපානම යන ගම පන්නිපිටිය, බත්තරමුල්ල පාරේ පිහිටි මාරාගහවත්ත සහ ගොරකගහවත්ත කියන ඉඩමේ ඒ 1 දරන කොටසේ ඉතිරි බිම් වාසිය වන උතුරට : කේ විලියම් පෙරේරා විසින් අයිතිවාසිකම් කියන ලද ඉඩම ද, නැගෙනහිරට : බත්තරමුල්ලේ සිට පන්නිපිටිය බලා දිවෙන මහ පාර ද, දකුණට : ඒ 2 දරන කොටස (අඩි පහක් පළල පාරකට ඉතිරි කරන ලද බිම) ද, බස්නාහිරට : මීට පෙර විකුණන ලද පර්චස් හතේ බිම් වාසිය ද, මායිම් වන, පර්චස් හතකුත් - එකසීයයෙන් අසූ අට පංගුවක් (අ. 0, රූ. 0, ප. 7 88/100) විශාල ඉඩම සහ ඊට අයිති ගස, කොළ, පළතුරු ආදී සියල්ල ද එහි ඇති ගෙය ද වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1685/251, 252, 219 යන පත් ඉරුවල ලියාපදිංචි වී ඇත.

මැතක දී කරන ලද මැනීමක් අනුව මේ ඉඩම මෙසේ ද විස්තර වේ.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේපත්තුවේ මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මහරගම නගර සභා ඒකකයට අයත් වන දෙපානම යන ගම පන්නිපිටිය, බත්තරමුල්ල පාරේ පිහිටි "මාරාගහවත්ත සහ ගොරකගහවත්ත" කියන ඉඩමේ ඒ 1 දරන ඉඩමේ කොටසක් වන පී. ෆීලික්ස් ඩයස් බලයලත් මිනින්දෝරු තැන විසින් 1997.10.26 දින මැන සාදන ලද 197ඒ දරන පිඹුරේ දැක්වෙන ලොට් ඒ 1 දරන කැබැල්ල වන උතුරට : කේ විලියම් පෙරේරාට අයත් ඉඩම ද, නැගෙනහිරට : බත්තරමුල්ලේ සිට පන්නිපිටිය බලා යන ප්‍රධාන පාර ද, දකුණට : අංක 197 දරන පිඹුරේ ලොට් ඒ 2 දරන (පාරකට වෙන් කළ බිම් තීරය ද), බස්නාහිරට : 197 පිඹුරේ ලොට් ඒ 1 ඉතිරි කොටස ද, මායිම් වන, පර්චස් හතක් (අ. 0, රූ. 0, ප. 7) විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ, පළතුරු ආදී සියල්ල ද එහි ඇති ගොඩනැගිල්ල ද වේ.

3. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරළයේ ගඟබඩ පත්තුවේ බුලත්සිංහල පිහිටි, විදානෙලාගේ වත්තේ පිට කට්ටිය කියන ඉඩමට මායිම් උතුරට : ගැමියන් අයිතිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : අංක 313842 දරන අයිතිකම් ප්ලෑනයේ සඳහන් ඉඩම සහ අංක 15842 දරන මුල් පිඹුරේ අංක 6648 දරන බිම් කට්ටිය ද, දකුණට : රජය සතු ඉඩම ද, බස්නාහිරට : අංක 280762 දරන අයිතිකම් ප්ලෑනයේ සඳහන් ඉඩම ද යන මෙකී මායිම් තුළ අක්කර එකකුත්, රූඩ් තුනකුත්, පර්චස් විසිපහක් (අ. 1, රූ. 3. පර්. 25) විශාල ඉඩමේ බිමෙන් ඊට අයිති ගහකොළ, පළතුරු ආදී සියළු දෙයිනුත් නොබෙදූ දෙකෙන් පංගුවෙන් දෙකෙන් පංගුව (1/2 න් 1/2) වේ.

මෙම ඉඩම මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 159/246, 267 යටතේ ලියාපදිංචි කර ඇත.

03 - 737

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.